# උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලා සිසුන්ට (HNDA) 2015.10.29 දින සිදු කළ පොලිස් පහරදිම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන වාර්තාව

**(පැමිණිලි අංක HRC/3824/15 සහ HRC/3827/15)**

**දෙසැම්බර් 2015**

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**<u>උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලා සිසුන්ට (HNDA)</u>**

**<u>2015.10.29 දින සිදු කළ පොලිස් පහරදීම සම්බන්ධයෙන්</u>**

**<u>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන වාර්තාව</u>**

01. ජාතික බලය සංවිධානය,
47/ඒ, පළමු පටුමග, රාවතාවත්ත,
මොරටුව.

02. ලහිරු වීරසේකර මයා ඇතුළු පිරිස,
කොත්මලේ පාර, මාවතුර,
ගම්පොල.

**පැමිණිලි පාර්ශවය :**

**– එදිරිව –**

01. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. පූජිත ජයසුන්දර මහතා,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (බස්නාහිරපළාත),
පොලිස් මූලස්ථානය, කොළඹ 01.

03. ගාමිණී මතුරට මහතා,
නියෝජ්‍ය පොලිස්පති, (කොළඹ දිසාව භාර),
අංක – 331, ඕල්කට් මාවත, කොළඹ.

04. චම්පික සිරිවර්ධන මහතා,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි(මධ්‍යම)
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

05. පාලිත පනාමල්දෙණිය මහතා,
පොලිස් අධිකාරී (කොළඹ දකුණ කොට්ඨාස භාර),
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

06. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
පිටකොටුව.

07. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
කොටුව.

08. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
මරදාන.

09. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
දෙමටගොඩ.

10. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
බොරැල්ල.

11. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
කුරුඳුවත්ත.

12. ලේකම්,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය,
වෝඩ් පෙදෙස, කොළඹ 07.

**වගඋත්තර පාර්ශවය :**

**වර්ෂ 2015 ක් වූ දෙසැම්බර් මස 04 වන දින දී ය.**

**පැමිණිලි අංක HRC/3824/15 සහ HRC/3827/15**

## 1. **හැඳින්වීම**:-

2015.10.29 දින උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (HNDA) සිසුන් පවත්වන ලද උද්ඝෝෂණයේදී පොලිස් නිලධාරීන් සිසුන් හට පහරදීම සම්බන්ධයෙන් 1996 අංක 21 දරණ මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 14 වගන්තියේ බලතල ප්‍රකාරව ස්වකීය මැදිහත් වීමෙන් (*suo motu*) විමර්ශනයක් ආරම්භ කිරීමට කොමිෂන් සභාව තීරණය කිරීමෙන් අනතුරුව HNDA සිසුන් වෙනුවෙන් ජාතික බලය සංවිධානය විසින් HRC/3824/15 අංකය යටතේද HNDA සිසුන් විසින් HRC/3827/15 අංකය යටතේ ද පැමිණිල්ල ගොනු ගත කරන ලදී.

මෙකී කාරණා කරණකොට ගෙන, කොමිෂන් සභාව විමර්ශන කටයුතු මෙහෙයවන ලද අතර 2015.11.03 දින හා 2015.11.05 දින සියළු පාර්ශවයන් කොමිෂන් සභාව ඉදිරියට කැඳවීමට මානව හිමිකම් කොමිෂන් සභාව පියවර ගැනීමෙන් අනතුරුව වගඋත්තරකරුවන්ගේ ලිඛිත වාර්තා ලබා ගැනීමට ද පියවර ගනු ලැබීය.

එම පරීක්ෂණයේදී ඉදිරිපත් වූ කරුණු,පැමිණිලිකරුවන්ගේ හා වගඋත්තරකරුවන්ගේ ලිඛිත සැළකිරීම්, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මගින් ප්‍රචාරය වන ලද කරුණු, අධිකරණ වෛද්‍ය වාර්තා පාර්ශවයන් විසින් ඉදිරිපත් කරනු ලැබූ වීඩියෝ දර්ශන, නීති විරෝධී රැස්වීම් විසුරුවා හැරීම සඳහා අදාළ වන්නා වූ නීති රෙගුලාසි, අන්තර් ජාතික නීතිමය තත්ත්වය පිළිබඳව අවධානය යොමු කිරීමෙන් අනතුරුව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සකස් කරනු ලබන විමර්ශන වාර්තාවයි.

## 2. **පැමිණිල්ලේ කරුණු දැක්වීම** :-

### 2.1. **පළමු පැමිණිලිකරු වන ජාතික බලය සංවිධානය මගින් ඉදිරිපත් කළ ලිඛිත කරුණු දැක්වීම :**

අන්තර් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (HNDA) ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) වෙත තම දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව නොදීම හේතුකොට ගෙන ඇති වූ කථාබහෙන් පසුව ඇතිවූ අර්බුධකාරී තත්ත්වය හේතුවෙන් එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඉතා මෘලේච්ඡ ලෙස පහරදී තුවාල සිදුකොට අපහසුතාවයට පත් කිරීම හා අනතුරුව අත්අඩංගුවට ගැනීම රෝහල් ගතකිරීම හා පළවා හැරීම.

පැමිණිලිකරු ඉහත පැමිණිල්ල ගොනු කරමින් කොමිෂන් සභාවෙන් අපේක්ෂා කර සිටින්නේ, අදාළ සිදුවීම සම්බන්ධව වගකිවයුතු පොලිස් නිලධාරීන් සම්බන්ධව විනයානුකූල පියවර ගනිමින්, මින් ඉදිරියට මෙවැනි ම්ලේච්ඡ පහරදීම සිදු නොවීමට වගබලා ගන්නා ලෙස ය. (ඇමුණුම 01)

## 2.2. පළමුවන පැමිණිලිකරුගේ වාචික සැලකිරීම් :

2015.11.05 දින සියළුම පාර්ශවයන් කැඳවා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවැත්වූ පරීක්ෂණයේදී,

පළමුවන පැමිණිල්ලේ පාර්ශවකරු වන, ජාතික බලය සංවිධානය වෙනුවෙන් සරත් මනමේන්ද්‍ර මහතා ප්‍රකාශ කර සිටියේ, " මෙම ශිෂ්‍ය ව්‍යාපාරයට පොලිසිය විසින් අමානුෂික ලෙස පහර දී ඇති බවත් එම පහරදීම් සම්බන්ධයෙන් රජයේ හා විපක්ෂයේ දේශපාලනඥයන් විසින් මාධ්‍ය මගින් කරුණු ඉදිරිපත් කර ඇති බවත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වල මේ සම්බන්ධව විශාල වශයෙන් ප්‍රචාරය වූ බවත් " ය. ඒ බව සනාථ කිරීමට පුවත්පත් උධෘත ඉදිරිපත් කරන ලද අතර පොලිසිය විසින් එල්ල කරන ලද ජල ප්‍රහාරය හා කඳුළු වායු ප්‍රහාරය පිළිබඳව තමන් හට ගැටළුවක් නොමැති බව ද, තවදුරටත් ප්‍රකාශ කරන ලදි. පොලිස් නිලධාරීන්ගේ අත්තනෝමතික ක්‍රියාකාරීත්වය සම්බන්ධව විනයානුකූල පියවර ගන්නා ලෙස බලධාරීන්ට දැනුම් දෙන ලෙසට කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කරන ලදි.

## 2.3. දෙවන පැමිණිලිකරුවන්ගේ ලිඛිත කරුණු දැක්වීම : (ශිෂ්‍යයන්)

පැමිණිලිකරුවන් ප්‍රකාශ කර සිටින්නේ, උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වසර ගණනාවක සිට නොවිසඳුනු පරිපාලන ගැටළු රාශියක් තිබුණු බවත්, එම හේතුවෙන් ශිෂ්‍යයන් පීඩණයට ලක් වී සිටි බවයි. ඒ අතර HNDA පාඨමාලාවට හිමි උපාධි සමානාත්මතාවය නැවත බලාත්මක නොකිරීම, උසස් තාක්ෂණ ආයතනය තුළ උපාධි පාඨමාලා මුදලට විකිණීමට සැලසුම් දියත් කිරීම, HNDA සිසුන්ගේ මහපොළ වාරිකය අනික් සිසුන්ට මෙන් රු.5,000/- ක් වෙනුවට රු. 1,250/-ක් පමණක් ලබාදීම, යන කාරණා සම්බන්ධයෙන් ඉල්ලීම් ඉදිරිපත් කළත් ඒවා අසාර්ථක වූ බැවින් ශිෂ්‍ය විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කළ බවත් ප්‍රකාශ කර ඇත.

ඒ අනුව 2015.10.29 වන දින කොළඹ වෝඩ් පෙදෙසේ පිහිටි උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය දක්වා සාමකාමී පා ගමනකින් ගමන් කොට විෂයය භාර අමාත්‍යවරයා සමග ඍජුව සාකච්ඡා කිරීමට සිසුන් තීරණය කළ බවත් ප්‍රකාශ කරයි. එදින කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිටින් මධ්‍යහ්න 12.00ට පමණ පා ගමනක් ආරම්භ කොට සිසුන් 1500ක් පමණ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ගමන් කළ බවත්, එසේ ගමන් කරන අවස්ථාවේදී පොලිසිය විසින් ඇස් රෝහල ඉදිරිපිටදී වෝඩ්

පෙදෙසේ මාර්ග බාධක යොදා අවහිර කළ බවත්, සිසුන් සාමකාමීව එම ස්ථානයේ රැඳී සිටිමින් අමාත්‍යවරයා සමග සාකච්ඡාවක් ලබාදෙන ලෙස උසස් පොලිස් නිලධාරින්ට දැන්වීමෙන් අනතුරුව අමාත්‍යවරයා පැමිණෙන තෙක් රැඳී සිටින ලෙසට උසස් පොලිස් නිලධාරින් පැමිණිලිකරුවන්ට උපදෙස් දුන් බවත් දන්වා සිටී.

නමුත් ටික වේලාවකින් පැමිණි පොලිස් නිලධාරින් එලෙස ඇමතිවරයා හමුවීමට නොහැකි බව සිසුන්ට දැන්වූ බවත්, එම ස්ථානයෙන් ඉවත් නොවුනහොත් බලහත්කාරයෙන් ඉවත් කරන බවට තර්ජනය කළ බවත් වැඩිදුරටත් දක්වා සිටී. ඇමතිවරයාගෙන් සාකච්ඡාවක් නොමැතිව සිසුන් එම ස්ථානයෙන් ඉවත් නොවන බව සාමාකාමීව පොලිස් නිලධාරින් වෙත දැන්වූ බවත්, එම අවස්ථාවේදී පොලිසිය විසින් සිසුන්ට ඉවත් වන ලෙස කිසිදු දැනුම්දීමක් නොකර ජල ප්‍රහාරයක් එල්ලකොට සිසුන්ව විසුරුවා හැරීමට උත්සාහ දරන ලද බවත් ප්‍රකාශ කර සිටී. අනපේක්ෂිත ලෙස සාමකාමී ලෙස සිටි සිසුන්ට ලෙස ජල ප්‍රහාර එල්ල කිරීම පිළිබඳව සිසුන් දැඩි කැළඹීමකට ලක්වූ බව දක්වා සිටින අතර පොලිසිය විසින් කිසිදු වගවිභාගයකින් තොරව කඳුළු වායු ප්‍රහාර එල්ල කරන ලද බව දන්වයි.

වායු ප්‍රහාරයෙන් පසුව සිසුන් බොහෝ දෙනෙකුගේ ඇස් වේදනාවකට ලක්වන ලද බවත්, එම ස්ථානයෙන් ඈතට ගොස් ජලයෙන් මුහුණ සෝදාගැනීමට ක්‍රියා කරමින් සිටින අවස්ථාවේදී පොලිස් නිලධාරින් **200**කට අධික පිරිසක් බැටන් පොලු වලින් සහ වෙනත් පොලු මුගුරු අතැතිව සිසුන් වෙතට කඩා වදින ලද බවත්, එම ස්ථානයේ කඳුළු වායු ප්‍රහාරය නිසා පීඩාවට පත්ව සිටි සිසුන්ට අමානුෂික ලෙස පහරදෙන ලද බවත් ප්‍රකාශ කර ඇත. එම ප්‍රහාරය නිසා සිසුන් **30**කට අධික ප්‍රමාණයක් තුවාල වී ඇති බවත්, එකී ප්‍රහාරයන් ශිෂ්‍යාවන් වෙතද එල්ල වූ බවත් පොලිසියට යටත් වී සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටද නොකඩවා පහරදුන් බවත් ප්‍රකාශ කර සිටී.

මෙම සිද්ධියත් සමග සිසුන් **39** දෙනෙකු පමණ පොලිසිය විසින් නීති විරෝධී අන්දමින් අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව අධිකරණය වෙත ඉදිරිපත් කොට අධිකරණය මගින් ඇප ලබාගෙන ඇති බවත් ප්‍රකාශ කර ඇත.

පොලිසියේ ඉහත ක්‍රියාකලාපය අනුව නීති විරෝධී අත් අඩංගුවට ගැනීමක් සිදුවී ඇති බවත්, ශිෂ්‍යයන්ට කෲර අමානුෂික සහ අවමන් සහගත සැලකිල්ලකට යටත් කර ඇති බවත්, අසමාන ලෙස සලකා ඇති බවත් භාෂණය හා ප්‍රකාශනයේ නිදහස, අදහස් පළ කිරීමේ අයිතිය, නිදහසේ යාම්ඊම් අයිතිය, පොලිසිය විසින් උල්ලංඝනය කර ඇති බවත් ඒ තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සදහන් මූලික අයිතිවාසිකම් වගඋත්තරකරුවන් විසින් කඩ කර ඇති බවත් ප්‍රකාශ කොට ඇත. **(ඇමුණුම 02)**

**2.4 දෙවන පැමිණිලිකරුවන් වන ශිෂ්‍යයන්ගේ වාචික සැලකිරීම් :-**

උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ සිසුන් වෙනුවෙන් අන්තර් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව සුරැකීමේ ශිෂ්‍ය එකමුතුවේ කැඳවුම්කරු වන ධම්මික රුවන් මහතා ප්‍රකාශ කර සිටියේ, තම ඩිප්ලෝමාව පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ්‍යවේදී උපාධියට සමාන පිළිගැනීමක් ලබා ගැනීමටත් අනෙකුත් විශ්ව විද්‍යාල සිසුන්ට ලබාදෙන ශිෂ්‍යාධාරය වන රු5000/-ක් ලබා ගැනීමටත් විරෝධතා පා ගමනක් කොටුව දුම්රිය ස්ථානයෙන් ආරම්භ කොට වෝඩ් පෙදෙසේ පිහිටි උසස් අධ්‍යාපන අමාත්‍යාංශය දක්වා ගමන් කළ බවත් පොලිස් නිලධාරීන් පා ගමන ආරම්භයේ සිට වෝඩ් පෙදෙස දක්වා ගමන් කරන තෙක් කිසිදු අවහිරයකින් තොරව ගමන් කිරීමට ඉඩ ලබා දුන් බවත් වෝඩ් පෙදෙසට පැමිණීමෙන් පසුව උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ඇමතිවරයා මුණගැසීමට අවශ්‍ය බව දැන්වූ විට ඇමතිවරයා එම ස්ථානයේ නොමැති බැවින් අමාත්‍යාංශයට ඇතුල් වීමට ඉඩ ලබාදීම නොහැකි බවට තර්ජනය කරන ලද අතර ජල ප්‍රහාර සහ කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීමෙන් අනතුරුව ශිෂ්‍යයන්ට ම්ලේච්ඡ ලෙස පහර දුන් බව ප්‍රකාශ කරන ලද අතර, කඳුළු ගෑස් ප්‍රහාරයෙන් අඩපණ වී සිටි සිසුන්ට හා බිම වැටී සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පහර දුන් බවට තවදුරටත් ප්‍රකාශ කරන ලදි.

මෙම විරෝධතා ව්‍යාපාරය පවත්වන බවට සතියකට පෙර සිට මාධ්‍ය මගින් ප්‍රචාරය කිරීමට කටයුතු කළද අදාල බලධාරීන් මුණගැසීමට කාල වේලාවක් කලින් වෙන් කර ගැනීමක් හෝ අවසර ලබාගැනීමක් කර නොතිබූ බවද ප්‍රකාශ කරන ලදි.
**(ඇමුණුම 03)**

## 3. <u>පැමිණිල්ල සනාථ කිරීමට ඉදිරිපත් කරන සාක්ෂි</u> :-

**3.1. අධිකරණ වෛද්‍ය වාර්තා :**

පැමිණිලිකරුවන් විසින් ලබාදුන් ලේඛනය අනුව පහරදීමට ලක්වී රෝහල් ගතවූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අදාල වෛද්‍ය වාර්තාවන් කොළඹ ජාතික රෝහලේ අධිකරණ වෛද්‍ය වරයාගෙන් කැඳවීමට මානව හිමිකම් කොමිෂන් සභාව පියවර ගන්නා ලදි. එම වෛද්‍ය වාර්තා අනුව මෙම ශිෂ්‍යයන්ට පොලිසිය විසින් පහරදුන් බව ශිෂ්‍යයන් විසින් රෝගී ඉතිහාසයන් සඳහන් කර ඇති අතර ඔවුනට සිදුවී ඇති තුවාල සම්බන්ධව අධිකරණ වෛද්‍යවරයා සටහන් යොදා ඇත. එම වෛද්‍ය වාර්තාවල සාරාංශ පහත පරිදි වේ. **(ඇමුණුම 04)**

**අදාල උද්ඝෝෂණයේදී පහරදීමට ලක් වී තුවාල ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධිකරණ වෛද්‍ය වාර්තා වල සාරාංශ :–**

### 3. 1.1. Jiva Rupasinghe ( MLF No: 48/15 )

**Short History Given by Patient**

While protesting in front of the University Grants Commission, she accidentally fell down on the ground on 29/10/2015 around 2.30 p.m.

Nature, Size, Shape, disposition and site of injury

1. Contusion, measuring 3 x 3cm over tip of the right shoulder joint.
2. Abrasion, measuring 3 x 2cm oval in shape in the front of the left leg just below the left knee joint. Underling bone has no fracture according to Xray No – 85271.

### 3.1.2. Sanduni Chandrasiri ( MLF NO : 31/15 )

**Short History Given by Patient**

While protesting in front of the University Grants Commission on 29/10/2015 around 3.30 p.m. She developed fainting attack and difficulty in breathing due to exposure of gas.

Nature, Size, Shape, disposition and site of injury

No external injuries.

There is redness of throat due to acute throat inflammation.

### 3.1.3. Fathima Haneena Husane ( MLF No : 32/15 )

**Short History Given by Patient**

While protesting in front of the University Grants Commission on 29/10/2015 around 3.40 p.m. she was assaulted by police officer with police baton.

Nature, Size, Shape, disposition and site of injury

1. Scalp contusion in back of the head over right parietal region.
2. Contusion, measuring 3 x 2cm oval in shape placed over back aspect of the right shoulder joint. Underlying bone has no fracture according to the X ray No- 85219.

**3.1.4. Sashini Sandeepani Kumarasiri ( MLF No : 33/15 )**

**Short History Given by Patient,**

While protesting in front of the University Grants Commission on 29/10/2015 around 3.00 p.m. She was assaulted by police officers with police baton over her head and back of the chest. She has been discharged and readmitted again on 01.11.2015 as she was having on and off pain in the back of the head.

**Nature, Size, Shape, disposition and site of injury**

1. Scalp contusion over the left parietal eminence at the back of the head on left side. CT scan of brain has been performed after readmission according to the CT scan report No-6694 underling skull bone has no fracture and there is no evidence of bleeding into the cranial cavity.

2. Tramline contusion (Two linear contusions parallel to each other) vertically place over the right shoulder blade, measuring 2 x 1.5cm and 1 c.m. gap between two contusions throughout the length. Underlying bone has no fracture according to the Xray No-85226.

3. Contusion, measuring 2 x 1cm oval in shape placed over right shoulder blade just above to the injury No (2).

**3.1.5. Buddhika Ukwatta ( MLF No : 44/15 )**

**Short History Given by Patient**

While protesting in front of the University Grants Commission on 29/10/2015 around 3.00 p.m. she was assaulted by police officer with the police baton and she fell down on the ground. She develops throat pain due to exposure of gas.

**Nature, Size, Shape, disposition and site of injury**

1. Abrasion, measuring 0.5 X 0.5cm over the dorsa (back) aspect of the right hand, just distal to the wrist joint.

2. Tenderness over the tip of the right shoulder joint. Underlying bone has no fracture according to the Xray No-85263.

3. Tenderness over the center part of the lumbar region.

4. There is redness of throat due to acute throat inflammation.

**3.1.6. Ayesh Rathnayake ( MLF No : 36/15 )**

**Short History Given by Patient**

**History of assault**

He was assaulted by several police officers with baton poles, on 29.10.2015 around 4p.m. to 4.30 p.m. on University student's protest infront of UGC.

**Nature, Size, Shape, disposition and site of injury**

1. Lacerated wound 5cm long on the right side of the head.
2. Abrasion 1cm x 1cm area on the left side of the forehead.
3. Abrasion 1.5cm 0.5cm on the right side toe.

**3.1.7. Supun Eshan ( MLF No : 35/15 )**

**Short History Given by Patient**

**History of assault**

He was assaulted by several police officers, with baton poles, on 29.10.2015 around 4 p.m. – 4.30 p.m. on University students protest in front of UGC.

Nature, Size, Shape, disposition and site of injury
Lacerated wound 4cm long on the back of the right forearm just below the right elbow.

**3.1.8. A. Lasitha Pradeep Athukorala ( MLF No : 46/15 )**

**Short History Given by Patient**
**History of assault**
He was assaulted by several police officers with baton poles, on 29.10.2015, around 4.00 p.m. – 4.30 p.m. on University students' protest infront of UGC.

**Nature, Size, Shape, disposition and site of injury**

1. Lacerated wound 3.5cm long on the back of the right forearm.
2. Abrasion 1cm x 2cm area on the back of the right hand.
3. Contusions on both the knee joints.

**3.1.9. Gemiluka Niluka Nayana ( MLF No : 45/15 )**

**Short History Given by Patient**

While protesting in front of the University Grants Commission 29.10.2015 around 3.00 p.m. she was assaulted by police officer and she fell down on the ground.

**Nature, Size, Shape, disposition and site of injury**

1. Abrasion, measuring 0.5 x 0.5 cm oval in shape over the extensor surface of the right wrist joint.

2. Abrasion, measuring 0.5 x 0.5 cm oval in shape in inner aspect of palmar aspect of left hand just distal to the left wrist joint, underlying bone has no fracture according to the Xray No-85270.

3.1.10. පැමිණිලිකාර පාර්ශවය විසින් රෝහල් ගතවූ අයගේ නාම ලේඛනය ලෙස සිසුන් 10 දෙනෙකු සම්බන්ධයෙන් තොරතුරු ලබාදී තිබුණු අතර සිසුන් **09** දෙනෙකු සම්බන්ධව අධිකරණ වෛද්‍ය පෝරම නිකුත් කර ඇති බවත් චින්තා වෛද්‍යසූරිය නමින් රෝගියෙක් ඇතුලත් කර නොමැති බවත් අධිකරණ වෛද්‍ය පෝරමයක් නිකුත් වී නොමැති බවත් ස්ථානාධිපති, රෝහල් පොලිසිය විසින් 2015.11.12 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දන්වා ඇත. **( ඇමුණුම 05 )**

**3.2. පුවත්පත් වාර්තා :**

2015.10.30 – 2015.11.02 දක්වා දිනයන්හි දී ලංකාදීප, ලක්බිම, දිවයින The Island යන පුවත්පත් වල මෙම සිද්ධියට අදාලව වාර්තා කර තිබූ අතර ශිෂ්‍යයන්ට පහර දෙන ආකාරය දැක්වෙන ඡායාරූප ඊට ඇතුලත් වී තිබුණි. මෙම ඡායාරූප හා පුවත්පත් වාර්තා පැමිණිලි පාර්ශවය විසින් කොමිෂන් සභාවට ලබාදී ඇත.
**( ඇමුණුම 06 )**

**3.3. ඡායාරූප හා වීඩියෝ පට :**

මෙම ශිෂ්‍යයන්ට පහරදීම සම්බන්ධව ලබාගත් ඡායාරූප හා වීඩියෝ ශිෂ්‍යයන් විසින් ඉදිරිපත් කර ඇත. එම ඡායාරූප වල බැටන් පොලු වලින් පහරදෙන ආකාරය දැක්වන ඡායාරූප හා වීඩියෝ දර්ශන ඇතුලත් කර ඇත. මීට අමතරව වගඋත්තරකරුවන් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද වීඩියෝ දර්ශන දෙකක් ද ඇතුලත් විය. **( ඇමුණුම 07 )**

## 4. වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

### 4.1. වගඋත්තර පාර්ශවයේ වාචික කරුණු දැක්වීම :

පැමිණිලි සම්බන්ධව 2015.11.05 යන දිනයන්හි දී මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පවත්වන ලද පරීක්ෂණයේදී වගඋත්තරකරුවන් ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති – පූජිත ජයසුන්දර මහතා, නියෝජ්‍ය පොලිස්පති (කොළඹ දිසාව භාර) ගාමිණී මතුරට මහතා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, පාලිත සිරිවර්ධන මහතා, හිටපු මාධ්‍ය ප්‍රකාශක අජිත් රෝහණ මහතා ඇතුළු වගඋත්තරකරුවන් කරුණු ඉදිරිපත් කරන ලදි.

#### 4.1.1 ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අජිත් රෝහණ මහතා ඉදිරිපත් කරන ලද කරුණු :

පොලිස් ආඥා පනතේ 56 වන වගන්තිය අනුව පොලිස් නිලධාරියා රටේ අපරාධ වැළැක්වීම සඳහා කටයුතු කළ යුතු බවත්, එසේම 56(බී) මගින් රටේ සාමය ආරක්ෂා කිරීම පොලිස් නිලධාරියෙකුගේ වගකීම බවත් ප්‍රකාශ කරන ලදි.

එසේම, පොලිස් ආඥා පනතේ 77 වන වගන්තිය අනුව පෙරහැරක් ආරම්භ වීමට පෙර යටත් පිරිසෙයින් පැය හයකට පෙර පෙරහැර ආරම්භ වීමට නියමිත ස්ථානයට ආසන්නතම පොලිස් ස්ථානය භාර නිලධාරීන් වෙත ඒ පිළිබඳ ලියවිල්ලකින් භාරදිය යුතු බවත්, එසේ නොමැති නම් ප්‍රසිද්ධ ස්ථානයක පෙරහැරක් නොපැවැත්වීම හෝ කරනු නොලැබිය යුතු බවත් දක්වා ඇත. මෙම සිද්ධියට අදාළව මෙම පෙරහැර දෙහිවල ප්‍රදේශයෙන් ආරම්භ කර ඇති බවත් එම නිසා 3Km ක දුර ප්‍රමාණයක් පාර අවහිර වූ බවත්, එවැනි ක්‍රියාවන් වැළැක්වීමට කටයුතු කළ යුතු බවට පොලිස් ආඥා පනතේ සඳහන් වන බව ප්‍රකාශ කරයි. එසේ නොකළහොත් එම ආඥා පනතේ 55 වන වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් වන බව ද දක්වා ඇත. උද්ඝෝෂකයන් උද්ඝෝෂණයක් පවත්වන බවට පොලිස් නිලධාරීන් දැනුවත්වී නොසිටි බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එසේම අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 8 පරිච්ඡේදයේ 95(1) වගන්තියට අනුව නැනැත්තන් විසුරුවා හැරීම යම් මහේස්ත්‍රාත්වරයෙකු හෝ පොලිස් පරීක්ෂකවරයෙකුගේ පදවියට නොඅඩු පදවියක් දරණ යම් පොලිස් නිලධාරියෙකු විසින් අණ කළහැකි බව දක්වාලන අතර, එසේම 95 (2) වගන්තිය යටතේ එවැනි රැස්වීමක් අණ කිරීමකින් විසිර නොගියහොත් විසුරුවා හැරීමට සාධාරණ ලෙස අවශ්‍ය යම් බලයක් භාවිතා කර විසුරුවා හැරීම කළහැකි බව දක්වා ඇත.

මෙය නීති විරෝධී නොවන බවත්, සාමකාමී රැස්වීමක් බව සියලුදෙනා දක්වා සිටියද, දණ්ඩ නීති සංග්‍රහයේ 138 වගන්තිය කෙරෙහි අවධානය යොමු කරන ලෙස දක්වයි. එහි දක්වා ඇත්තේ පස්දෙනෙකු හෝ ඊට වැඩි ගණනකගේ පොදු පරමාර්ථය පහත දැක්වෙන කරුණු වලින් යමක් නම්, එය නීතිවිරෝධී රැස්වීමක් බවයි. යම් අනර්ථයක් හෝ සාපරාධී අයුතු ඇතුල්වීමක් හෝ වෙනත් වරදක් නම් එයද මෙම ගණයට වැටෙන අතර, සිසුන් වෝඩ් පෙදෙස හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පාර අවහිර කරන ලද බවත්, පාර අවහිර කිරීම තුලින් අයුතු අවහිරය ජනිත වූ අතර පොලිස් ආඥා පනතේ 80 වගන්තිය යටතේ අවසරයකින් තොරව ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතයද වරදක් වන බවද දක්වන ලද අතර, එයද මෙහිදී සිදු කරන ලද බවත්, ඒ අනුව ඉහත දැක්වූ දණ්ඩ නීති සංග්‍රහයේ 138 අනුව පාර අවහිර කිරීම තුලින් නීති විරෝධී රැස්වීමක් වූ සිදු කල බව දක්වයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් අයිතීන් වලට සාමකාමී රැස්වීම අයත් වුවද **<u>බර්නාඩ් සොයිසා සහ තවත් අය එදිරිව නීතිපති</u>** නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මාර්ක් ප්‍රනාන්දු මහතා දක්වා සිටියේ සාමකාමී වුවද, පොදු ස්ථානවල රැස්වීම් පැවැත්විය නොහැකි බව යන්න ප්‍රකාශ කරයි. එසේම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සීමාකිරීම් වලට අනුවද සාමකාමී රැස්වීම සීමා කළ හැකි බවට තවදුරටත් දක්වයි. මෙම සිද්ධියට අදාලව එම ස්ථානයේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මෙන්ම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, ඊට අමතරව ජාතික රෝහලද පිහිටා ඇති අතර රෝහල වෙත ගිලන් රථ 100ක් පමණ එන නමුත්, මෙම අවහිරය ගිලන් රථ සඳහා තදින් බලපාන ලද බව කියා සිටී. එසේම පොලිස් නිලධාරීන් මෙය වැළැක්වීමට උත්සාහ නොකළහොත් ඒ තුලින් රටේ ජනතාව ප්‍රශ්න කරනු ඇති බවට කරුණු ඉදිරිපත් කරන ලදි.

එසේම ජාතික මහාමාර්ග පනත යටතේද මෙය වරදක් වන අතර, ලිප්ටන් වටරවුම යනු, කොළඹ නගර මධ්‍යයේ පිහිටි ප්‍රධානතම ස්ථානයක් බව ප්‍රකාශ කරයි. එය අවහිරවීම තුලින් එම වේලාවට අනුව මිනිසුන් විශාල ගැටළුවකට මුහුණ පෑමට සිදු වන බව කියා සිටී. සිසුන් 1200ක ගේ අවහිරතාවය මිනිසුන් මිලියන ගණනකට ප්‍රශ්නයක් වනු ඇති බවත් එක් කොටසකගේ අයිතිවාසිකම් වෙනුවෙන් අනික් අයගේ අයිතිවාසිකම් මගහැරිය නොහැකි බවත් කියා සිටින අතර, ඒ බව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රඥප්තියේ 30 වගන්තියේ දක්වා ඇති බවට කරුණු ඉදිරිපත් කරයි. ඒ අනුව මෙහිදී පොලීසිය, පවතින ප්‍රතිපාදන අනුව කටයුතු කළ බවටද අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ දක්වා ඇති ප්‍රතිපාදන අනුවද අදාල උද්ඝෝෂණය මැඩ පැවැත්වූ බවත්, ඒ සඳහා සාධාරණ බලයක් යෙදවීමට සිදුවූ බවද කොමිසම ඉදිරියේ ප්‍රකාශ කර සිටින ලදි. ඊට අමතරව **<u>විජේසිරිවර්ධන එදිරිව කුමාර</u>** නඩුවේදී දක්වා ඇත්තේ, අවම බලය තවදුරටත් ක්‍රියාත්මක නොවන බවත්, එය සාධාරණ බලය ලෙස අර්ථ නිරූපණය කර ඇති බවටත් ප්‍රකාශ කරන ලදි.

### 4.1.2 නියෝජ්‍ය පොලිස්පති (කොළඹ දිසාව භාර) ගාමිණී මතුරට මහතා ඉදිරිපත් කරන ලද කරුණු:

මෙම උද්ඝෝෂණය නිසා මහා මාර්ගයේ දැඩි වාහන තදබදයක් ඇතිවූ බවත් ශිෂ්‍යයන් යුනියන් පෙදෙස සහ ඩීන්ස් පාර වටකරගෙන සිටීම හේතුවෙන් පොලිස් නිලධාරීන් උපක්‍රමයක් ලෙස හඹාගෙන ගොස් කෑ ගසා ශිෂ්‍යයන් පාලනය කිරීමට උත්සාහ කළ බවත් ජල ප්‍රහාර හා කඳුළුගෑස් යෙදීමෙන් ඔවුන් ඉවත් නොවූ නිසා බැටන් පොලු පාවිච්චි කළ බවත් අවස්ථානුකූලව පොලිස් නිලධාරීන් කටයුතු කළ බව ද ප්‍රකාශ කරන ලදි. "මෙම සිද්ධිවීමෙහි වගකීම ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියා හැටියට තමා භාර ගන්නේද" , වශයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනිය විසින් නගන ප්‍රශ්නයට පිළිතුරු දෙමින් ප්‍රකාශ කර සිටියේ, එම වගකීමෙන් බැහැර වීමට තමාට හැකියාවක් නොමැති බවයි. තවදුරටත් මෙම සිදුවීම සම්බන්ධව දේශපාලන අධිකාරියකින් හෝ පොලිස් මූලස්ථානයෙන් උපදෙසක් හෝ අණ ලබාදීමක් ලැබුණේ ද? වශයෙන් සභාපතිතුමිය නගන ලද ප්‍රශ්නයට පිළිතුරු දෙමින් ප්‍රකාශ කර සිටියේ එවැන්නක් සිදු නොවූ බවයි.

### 4.1.3 ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, පාලිත සිරිවර්ධන මහතාගේ කරුණු දැක්වීම :

මෙම උද්ඝෝෂණයට සහභාගී වූ සිසුන් 1300ක පමණ ප්‍රමාණයක් කොටුව දුම්රිය ස්ථානයට එක්රැස් වූ බවත් එම ස්ථානයේ සිට වෝඩ් පෙදෙස දිසාවට ඔවුන් ගමන් කරන විට ඒ අවට ඇති රජයේ ආයතන වල ආරක්ෂාව සොයා බැලීම පොලිස් නිලධාරීන්ගේ වගකීමක් බව ප්‍රකාශ කරන ලදි.

එමෙන්ම සිසුන්ට අවශ්‍ය බලධාරීන් මුණගැස්වීමට උත්සාහ කළ නමුත් ඇමතිතුමා හැරෙන්නට වෙනත් කෙනෙකු මුණ ගැසීමට සිසුන් අකමැති වූ බවත් සිසුන්ගේ උද්ඝෝෂණය පැය තුනක පමණ කාලයක් පැවතුන අතර පොලිස් නිලධාරීන් සිසුන්ට එරෙහිව අවසාන මොහොත තෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බවත් ප්‍රකාශ කරයි.

### 4.1.4. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, (බස්නාහිර පළාත) පූජිත ජයසුන්දර මහතාගේ ප්‍රකාශය :

ජාතික ආන්දෝලනයකට තුඩු දුන් මෙම සිද්ධිය පිළිබඳව පොලිස්පතිතුමාගේ ප්‍රකාශයක් මෙතෙක් සිදු නොවූයේ මන්දැයි සභාපතිතුමිය ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දෙමින් ප්‍රකාශ කර සිටියේ, පොලිස්පති වෙත ඇති අධික රාජකාරි කටයුතු හේතුවෙන් ද සිදුවීම සිදුවූ දිනට පසු දින විදේශ ගතවීම හේතුවෙනුත් එසේ ප්‍රකාශයක් නොකළ බවයි. ඒ අවස්ථාවේදී සභාපතිතුමිය එය විශාල අඩුපාඩුවක් බවත් මෙවැනි

අවස්ථාවක දී ආයතනයේ ඉහළම වගකිවයුතු නිලධාරියා ලෙස මේ සිද්ධිය පිළිබඳව මහජනතාවට කරුණු දැක්වීම ඉතා වැදගත් කාරණයක් බවට දන්වන ලදි.

## 4.2 වගඋත්තරකාර පාර්ශවය විසින් කොමිෂන් සභාව හමුවේ කරන ලද ලිඛිත කරුණු දැක්වීම :

මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පාර්ශවයන් කැඳවා 2015.11.03 දින කරන ලද පරීක්ෂණයෙන් අනතුරුව අදාල සිදුවීම සම්බන්ධව ලිඛිත වාර්තා කොමිෂන් සභාවට ලබාදීමට කටයුතු කරන ලෙසට කරන ලද දැන්වීමට අනුව වගඋත්තරකරුවන් 2015.11.05 දාතමින් වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. එම වාර්තාවට අනුව සිද්ධියට අදාළව පොලිස් නිලධාරීන් 226 ක් යෙදවූ බවත්, පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ කැරළි මර්ධන නිලධාරීන් සහභාගී වූ බව දන්වන අතර, මෙම උද්ඝෝෂණය විසුරුවා හැරීම සඳහා නිලධාරීන් වෙත පහත පරිදි උපදෙස් ලබා දුන් බවත් දක්වයි.

ඒ අනුව, මෙම උද්ඝෝෂණ පෙළපාලියේ යෙදෙන ශිෂ්‍යයින් සාමකාමී උද්ඝෝෂණයක යෙදෙන්නේ නම් නිලධාරීන්ට පසෙකට වී පෙළගැසී සිටීමටත්, ඔවුන් කලහකාරී ලෙස හැසිරෙන්නේ නම් ඔවුන්ට විසිර යාමට අවවාද කිරීමටත්, එම අවවාද කිරීමෙන් පසුව විසිර නොයා ඔවුන් තවදුරටත් කලහකාරී ලෙස හැසිරෙන්නේ නම් පළමුව ජල ප්‍රහාරයක් එල්ල කර පිරිස විසිර යාමට කටයුතු කිරීමටත්, එසේ ජල ප්‍රහාර එල්ල කිරීමෙන් පසුව තවදුරටත් කලහකාරී ලෙස හැරසින්නේ නම් දෙවනුව කඳුළු වායු ප්‍රහාරයක් එල්ල කිරීමටත්, එසේ කඳුළු වායු ප්‍රහාරය එල්ල කර පිරිස තවදුරටත් විසිරී නොයා නීති කඩ කළහොත් බැටන් ප්‍රහාරයක් එල්ල කිරීමටත් සූදානම් වන ආකාරයට පෙළ ගැසී බියක් ඇතිවන ආකාරයට කෑ ගසා හඬා ගොස් පලවා හැරීමට කටයුතු කළ යුතු බවට උපදෙස් ලබාදී ඇති බවට සඳහන් කර ඇත.

ප්‍රථමයෙන් විසිර යාම සඳහා කොළඹ දකුණ කොට්ඨාස භාර පොලිස් අධිකාරී පාලිත පනාමල්දෙණිය මහතා විසින් නිවේදනය කළ බවත්, විසිර නොයාම නිසා ජල බවුසර් 03 ක් යොදා ගත් බවත්, පසුව කඳුළු වායු උණ්ඩ 19 ක්ද, කඳුළු වායු බෝම්බ 3 ක් පමණද භාවිතා කළ බවත්, පසුව යෂ්ටි භාවිතා කරමින් විසුරුවා හැරිය බවත් දක්වා ඇති අතර පෙළපාලියක් විසුරුවා හැරීම පහත සඳහන් නීතිමය වගන්ති යටතේ ක්‍රියා කළයුතු බව ලිඛිතව දැනුම් දී ඇත.

| | | |
|---|---|---|
| (අ) | අපරාධ නඩු විධාන සංග්‍රහයේ | 95 වන වගන්තිය |
| (ආ) | මංමාවත් පනත | 59 (i) වගන්තිය |
| (ඇ) | පොලිස් ආඥා පනත | 77(i), (iii) හා 78/80 වන 56 වගන්තිය |
| (ඈ) | ලංකා දණ්ඩනීති සංග්‍රහය | 138/140 වන වගන්තිය |
| (ඉ) | දෙපාර්තමේන්තු නියෝග | ඒ 18 සහ 19 |

මෙහිදී අත්අඩංගුවට ගත් සිසුන් අත්අඩංගුවට ගනු ලැබුවේ, දණ්ඩ නීති සංග්‍රහයේ 32 වගන්තිය සමග කියවියයුතු 140, 188, 314, 316 හා 2008/40 ජාතික මංමාවත් පනතේ 59(1) වගන්තිය යටතේ බව දක්වයි.

අත්අඩංගුවට ගත් සිසුන් 39 දෙනාගෙන් ප්‍රකාශ සටහන් කොට 2015.10.30 දින කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට බී 40933/1/15 යටතේ නීති විරෝධී රුස්වීමක සාමාජිකයකු වීම, පොලිස් නිලධාරීන්ට පහරදීම, අයුතු ජන රාශිය, ප්‍රධාන මාර්ගයන් අවහිර කිරීම, රාජකාරියට බාධා කිරීම, හා සුළු තුවාල සිදු කිරීම යන කාරණා පදනම් කරගෙන අත් අඩංගුවට ගෙන ඇති බව ප්‍රකාශ කර ඇත.

**( ඇමුණුම 08 )**

**4.3 12 වන වගඋත්තරකරු වන උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශ ලේකම්වරයාගේ කරුණු දැක්වීම :**

HNDA ශිෂ්‍ය ගැටළුව සම්බන්ධව 2015.11.20 දාතමින් වාර්තා කැදවන ලදුව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා 2015.11.26 දිනැතිව හා අංක HE/UD/02/SLI/32/HNDA II යටතේ වාර්තාවක් ලබාදී ඇත. එයට අනුව පැමිණිල්ලට යථෝක්ත උසස් ජාතික ගණකාධිකාරී ඩිප්ලෝමාව හදාරන සිසුන් මෙදින සාකච්ඡාවක් ලබාදෙන ලෙස උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයාට හෝ රාජ්‍ය අමාත්‍යවරයාට හෝ ලිඛිත හෝ වාචික ඉල්ලීමක් කර නොතිබූ බව සදහන් කරයි.

කෙසේ වෙතත් 2015.10.29 වන දින පෙ.ව 10.00ට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන භාර අධ්‍යක්ෂවරු සමග අමාත්‍යවරයා සහ අනෙකුත් නිලධාරීන් සමග ආයතනයේ ගැටළු කාර්ය මණ්ඩලයේ ගැටළු, සිසුන් සම්බන්ධ ගැටළු, සම්බන්ධව සාකච්ඡාවක් පැවැත්වූ බවත්, එම සාකච්ඡාවේදී මෙම පාඨමාලවේ ගැටළු පිලිබදව හා එය නිරාකරණය කරගැනීමට ගතයුතු පියවර පිලිබදව සාකච්ඡා කළ බව සදහන් කරයි. නමුත් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව හදාරන සිසුන් එදින අමාත්‍යවරයා හෝ තමා හමුවීමට ඉල්ලීමක් කර නොතිබුණු අතර සිසුන් උද්ඝෝෂණ පෙළපාලියක් පවත්වන බවට අමාත්‍යවරයා හෝ තමා ඇතුළු නිලධාරී මණ්ඩලය දැන නොසිටි බව දක්වයි.

2015.10.29 දින පෙ.ව 2.30ට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ අමාත්‍ය හා රාජ්‍ය අමාත්‍යවරුන් සහ ලේකම්වරයා විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සමග ගැටළු පිලිබදව සාකච්ඡාවක් බත්තරමුල්ල මගනැගුම ගොඩනැගිල්ලේ පිහිටි අමාත්‍යාංශ කාර්යාලයේදී පැවැත්වූ බව සදහන් කරන අතර එම අවස්ථාවේදී සිසුන් උද්ඝෝෂණ

පෙළපාලි පවත්වන බවට අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා වෙත දැනුම්දුන් බවට පසුව දැනුම්දුන් බවට සඳහන් කරයි. කෙසේ වෙතත් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ඉදිරිපිට උද්ඝෝෂණය කරන සිසුන් හට සාකච්ඡාවක් ලබාදෙන ලෙස පොලිසිය විසින් මෙම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වෙත ඉල්ලීමක් කර ඇති අතර, අදාළ සාකච්ඡාව සඳහා සිසුන් හට අවස්ථාවක් ලබාදෙන බවට පොලිසිය විසින් දන්වා තිබුණද එම නිලධාරීන් සමග සාකච්ජා කිරීමට සිසුන් අකමැත්ත ප්‍රකාශ කල බවද වාර්තාවේ සඳහන් වේ.

මෙම ගැටළුව පිළිබඳව මේ වනවිටත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අංක 46/90 දරණ චක්‍රලේඛනයේ බලාත්මක කරන ලෙස අමාත්‍යාංශය මගින් අමාත්‍ය මණ්ඩලයට සංදේශයක් ඉදිරිපත් කරනු ලැබූ බවත් එම චක්‍රලේඛනය බලාත්මක කිරීමට අංක 22/2015 දරණ 2015.11.17 දිනැති චක්‍රලේඛනයක් නිකුත් කරනු ලැබූ බවත් ඒ අනුව අදාළ ශිෂ්‍යයන්ගේ ගැටළුව විසඳා ඇති බවත් වාර්තාවේ වැඩිදුරටත් දක්වයි.
( **ඇමුණුම 09** )

## 5. <u>අදාළ නීතිමය ප්‍රතිපාදන</u> :-

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදය.
- 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය.
- දණ්ඩ නීති සංග්‍රහයයේ 19 වන අධිකාරිය.
- 1984 අංක 41 දරණ පොලිස් (සංශෝධිත) පනත.
- 2008 අංක 40 දරණ ජාතික මංමාවත් පනත.
- පොලිස් දෙපාර්තමේන්තු නියෝග.
- ජාත්‍යන්තර මානව හිමිකම් නීති තත්ත්වය
    - මානව අයිතිවාසිකම් පිළිබඳව විශ්ව ප්‍රකාශය.
    - සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය.

## 6. <u>නිරීක්ෂණ</u> :-

### 6.1. සිසුන්ගේ පා ගමන හා රැස්වීම :

- 2015.10.29 දින HNDA සිසුන් විසින් කොළඹ කොටුව දුම්රියපල අසළින් ආරම්භ කර වෝඩ් පෙදෙසේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය දක්වා විරෝධතා පාගමනක් ආරම්භ කර ඇති අතර පාගමන වෝඩ් පෙදෙස අසළට පැමිණෙන තෙක් පොලිස්

නිලධාරීන්ගෙන් සිසුන්ට සහාය ලැබී ඇති බව පාර්ශවයන්ගේ කරුණු දැක්වීම අනුව නිරීක්ෂණය වේ.

- ➢ මෙම පා ගමන පිළිබඳව ශිෂ්‍යයන් විසින් නීති ප්‍රකාරව අදාළ බලධාරීන්ට හෝ පොලිසිය වෙත පූර්ව දැනුම්දීමක් සිදුකර නොමැති බව පැමිණිලිකරුවන්ගේ කරුණු දැක්වීම අනුව නිරීක්ෂණය වේ.

- ➢ ශිෂ්‍යයින් විසින් සහ වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද වීඩියෝ පට හා පාර්ශවයන්ගේ කරුණු අනුව නිරීක්ෂණය වන්නේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට මීටර් කිහිපයක් දුරින් මාර්ග බාධක යොදා අවහිර කිරීමට පොලිස් නිලධාරීන් කටයුතු කළ බව.

- ➢ මෙම පාගමන හේතුවෙන් ප්‍රදේශයේ මාර්ග තදබදයක් ඇතිවූ බව වගඋත්තරකරුවන්ගේ කරුණු අනුව හා වීඩියෝ පට මගින් නිරීක්ෂණය විය.

- ➢ ශිෂ්‍යයින් විසින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ බලධාරීන් මුණ ගැසීමට අවස්ථාවක් ලබාදෙන ලෙසට පොලිස් නිලධාරීන්ගෙන් ඉල්ලීමක් කර ඇති බවත් එම අවස්ථාවේදී අදාල අමාත්‍යාංශයේ නොසිටි බැවින් සහකාර ලේකම්වරයෙකු මුණ ගැසීමට අවස්ථාවක් ලබාදිය හැකි බව වගඋත්තර පාර්ශවය දන්වා ඇති නමුත් සිසුන් එය ප්‍රතික්ෂේප කර ඇති බව දෙපාර්ශවයේ කරුණු අනුව අනාවරණය වේ.

- ➢ සිසුන් කලහකාරී ලෙස හැසිරීම ආරම්භ කර ඇත්තේ, ඔවුන් ඉල්ලා සිටි පරිදි උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉහළ බලධාරියෙකු හමුවීමට නොහැකි යයි ඔවුන් දැනගත් අවස්ථාවේදී බව පැහැදිලිවම නිරීක්ෂණය කළහැකි අතර ඒ දක්වා සිසුන් සාමකාමීව හැසිරුණු බව නිරීක්ෂණය වේ.

## 6.2. රුස්වීම විසුරුවා හැරීම :

- ➢ මෙම ස්ථානයේ සිසුන් **1500**කට ආසන්න ප්‍රමාණයක් රුස්ව සිටි බවට හා ජල ප්‍රහාරක රථ තුනක් කැරලි මර්ධන කණ්ඩායම් තුනක් හා පොලිස් ස්ථාන **17**කින් නිලධාරීන් **257**ක පමණ ප්‍රමාණයක් මෙම ස්ථානයේ රාජකාරියේ නියැලී ඇති බව වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම අනුව අනාවරණය වේ.

- ➢ මෙම සිද්ධියට අදාලව උපදෙස් දීම හා මෙහෙයවීම නියෝජ්‍ය පොලිස්පති – කොළඹ දිසාව, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී – කොළඹ මධ්‍යම, පොලිස් අධිකාරී – කොළඹ දකුණ, සහකාර පොලිස් අධිකාරී I, II, III හා කොළඹ ප්‍රදේශයේ ස්ථානාධිපතිවරු **13**ක් විසින් සිදු කර ඇති බව වගඋත්තරකරුගේ වාර්තා අනුව තහවුරු වේ.

- මෙම සිද්ධියට අදාලව කිසිදු කාන්තා නිලධාරිනියක් මෙම ස්ථානයට ස්ථානගත කර නැති බව අදාල ලේඛන හා වීඩියෝ පට, ඡායාරූප මගින් නිරීක්ෂණය වේ.

- මාර්ග බාධකය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ආසන්නයේම නොදැමීමට හේතුව ලෙස වගඋත්තරකරුවන් දක්වන ලද්දේ පෙර පැවති සිසුන් විසින් පවත්වන ලද උද්ඝෝෂණයකදී සිසුන්ගේ කලහකාරී හැසිරීම හා අයුතු ඇතුල්වීම නිසා රාජ්‍ය දේපලට හානි සිදුවූ බැවින් එවැන්නක් සිදුවීම වැළැක්වීමට බවයි. වගඋත්තරකරුවන් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති වීඩියෝ පට මගින් වගඋත්තරකරුවන්ගේ සිදු කර ඇති පූර්වේක්ෂණය සාධාරණ හා නිවැරදි තත්ත්වයක් බවට නිරීක්ෂණය විය.

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අමාත්‍යවරයා හමුවීමට නොහැකි බව පොලිස් නිලධාරීන් දැනුම් දීමෙන් පසු වෙනත් නිලධාරියෙකු හමුවීමට ශිෂ්‍යයින් අකමැත්ත ප්‍රකාශ කිරීම මත තවදුරටත් එම ස්ථානයේ බිම වාඩිවී සිටි බවට ශිෂ්‍යයන් කරුණු දක්වා සිටි අතර වගඋත්තර පාර්ශවය ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතයෙන් සිසුන්ට ඉවත්ව යන ලෙස දැන්වූ බව ප්‍රකාශ කළ ද එවැන්නක් සිදුවූ බව දෙපාර්ශවය විසින්ම ඉදිරිපත් කල කරුණු, ඡායාරූප, වීඩියෝ පට මගින් නිරීක්ෂණය නොවේ.

- සිසුන් මාර්ග බාධකය මත නැග දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කරමින් සිටි බව නිරීක්ෂණය වන අතර මෙම මාර්ග බාධකය බිඳ හෙළීමට ශිෂ්‍යයින් කටයුතු කරන ලද බව වගඋත්තර පාර්ශවය ප්‍රකාශ කර ඇති අතර ඒ බව වීඩියෝ පට මගින් ද තහවුරු වේ.

- එම අවස්ථාවේදී සිසුන් විසුරුවා හැරීමට වගඋත්තර පාර්ශවය විසින් ජල ප්‍රහාරක රථ උපයෝගී කරගත් බවත් එම ජල ප්‍රහාර වලට ඔරොත්තු දෙන ආකාරයට සිසුන් අත් අල්ලාගෙන පවුරක් ආකාරයෙන් සිටීම නිසා තවදුරටත් ජල ප්‍රහාර හමුවේ සිසුන් ඉවත් නොවන බැවින් කඳුළු ගැස් යෙදීම සිදු කල බව වීඩියෝ පට මගින් අනාවරණය වේ.

- ඉන් අනතුරුව වගඋත්තරකාර පොලිස් නිලධාරීන් විසින් කඳුළු ගැස් යෙදීම ආරම්භ කොට ඇති බවත් කඳුළු ගැස් ප්‍රහාර එල්ල වීමෙන් පසුව සිසුන් විසිර යාමක් සිදුවී ඇති බවට වීඩියෝ පට අනුව නිරීක්ෂණය වේ. කඳුළු ගැස් යෙදීම හේතුවෙන් සමහර සිසුන් අඩපණ වී බිම පතිත වී සිටි බව ද ඡායාරූප හා වීඩියෝ සාක්ෂි මගින් තහවුරු වේ.

- කඳුළු ගැස් ප්‍රහාරය හේතුවෙන් අඩපණ වී සිටි සිසුන් පලවා හැරීමත්, ඔවුන් පසුපස හඹා යමින් බැටන් පොලු හා ලී පොලු භාවිතා කරමින් දිව යන සිසුන්ට පිටුපසින් ද

වැටී සිටි සිසුන් ට ද බැටන් ප්‍රහාර එල්ල කරන බව වීඩියෝ සාක්ෂි, පැමිණිලිරුවන් කොමිෂන් සභාවට ලබාදෙන ලද ජායාරූප හා පුවත්පත් වල පලවන ලද ජායාරූප සාක්ෂි මගින් නිරීක්ෂණය වේ.

- තවදුරටත් එම පහරදීම් සමස්ථයක් ලෙස ශරීරයේ පසුපස ඉතාමත් සංවේදී ස්ථාන වන හිස, හිස පිටුපස, පිටකොන්ද ප්‍රදේශයට හා අතිකුත් ශරීර අවයවයන්ට එල්ල කරන ආකාරය වීඩියෝ හා ජායාරූප හා අධිරණ වෛද්‍ය සාක්ෂි මගින් අනාවරණය වේ.

- විසුරුවා හැරීම පිළිබඳව අවධානය යොමු කිරීමේදී පොලිස් නිලධාරීන්ට පිරිස් පාලනය පිළිබඳව වූ අණ පනත් හා රෙගුලාසි පිළිබඳ ප්‍රායෝගික ප්‍රමාණවත් දැනුවත් බවක් හා පුහුණුවක් තිසි අයුරින් ලැබී නොමැති බව නිරීක්ෂණය වේ.

**6.3. අත්අඩංගුවට ගැනීම :**

- මෙම සිද්ධියට අදාලව සිසුන් 39 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති බවත් ඔවුන් බම්බලපිටිය, කුරුදුවත්ත, වැල්ලවත්ත, කිරුළපන, කොල්ලුපිටිය, නාරාහේන්පිට යන පොලිස් ස්ථාන වල රඳවා තැබූ බවට සහ 2015.10.30 දින කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය වෙත බී 40933/1/15 යටතේ ඉදිරිපත් කොට ඇප මත මුදා හැර ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

- මොවුන් අත්අඩංගුවට ගෙන ඇත්තේ නීති විරෝධී රැස්වීමක සාමාජිකයන්ව සිට පොලිස් නිලධාරීන්ට පහරදී රාජකාරියට බාධා කිරීම සම්බන්ධයෙන් බවත්, මෙය දණ්ඩ නීති සංග්‍රහයේ 32 වගන්තිය සමග කියවුතු 140, 153, 314, 316 හා 2008 අංක 40 දරණ ජාතික මංමාවත් පනතේ 59(1) යටතේ බී වාර්තාව මගින් දැනුම් දී ඇත.

- අත්අඩංගුවට ගැනීමේදී හේතු පැහැදිලි නොකළ බව පැමිණිලි පාර්ශවය සඳහන් කරන අතර අත්අඩංගුවට ගන්නා ලද්දේ ඉහත දැක්වෙන වගන්ති බවට වගඋත්තරකරුවන් දක්වා ඇත. නමුත් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ ඔවුනට අත්අඩංගුවට ගැනීමට හේතුව පැහැදිලි කර දුන් බව හෝ නොදුන් බව යන්න පිළිබඳව නිගමනයකට එළඹීමට ප්‍රමාණවත් කරුණු නිරීක්ෂණය නොවේ.

**6.4. වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළයුතු බව :**

- පැමිණිලිකාර පාර්ශවය දිව්රුම් ප්‍රකාශ මගින් ඉදිරිපත් කරනු ලබන කරුණු අනුව වගඋත්තර පාර්ශවය විසින් සිසුන් වධහිංසාවට ලක් කිරීම පිළිබඳ කාරණය කෙරෙහි

අවධානය යොමු කිරීමේදී සිසුන්ට තුවාල සිදුවන ආකාරයට පහරදීමක් සිදු කර ඇති බවට වීඩියෝ පට හා ඡායාරූප මගින් තහවුරු වේ.

- ඉදිරිපත් කරන ලද වීඩියෝ පට අනුව අඩ පණව සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හා බිම වැටී සිටින සිසුන්ට අමානුෂික ලෙස දිගින් දිගටම පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකු වටවී පහරදීමකට ලක් කරන බව පැහැදිලිවම අවධානයට ලක් කළයුතු කාරණයක් බව නිරීක්ෂණය වේ.

- තවදුරටත් මෙම වගඋත්තරකරුවන්ගේ බැටන් ප්‍රහාර වලට ලක්වූ සිසුන් 09 දෙනෙකුගේ වෛද්‍ය වාර්තා නිරීක්ෂණය කිරීමේදී බොහොමයක් සිසුන්ට පහරදීම නිසා තැලීම් සීරීම් හා ධාරිත තුවාල හිස පිටුපස, පිට හා අත් පා පිටුපස ප්‍රදේශවල ඇති බවත් නිරීක්ෂණය වේ. තවදුරටත් තුවාල සිදුවී ඇති ආකාරය අනුව තහවුරු වන්නේ මෙම පහරදීම් සිදු කර ඇත්තේ පොලිස් නිලධාරීන්ට එරෙහිව ඉදිරියට එන පිරිසට නොව පොලිසිය මගහැර දිව යන පිරිසකට බව යි.

**6.5. වෙනත් කරුණු :**

- මෙම සිද්ධියේදී පොලිස් නිලධාරීන් 06 දෙනෙකුට ද තුවාල සිදුවී වෛද්‍ය ප්‍රථිකාර ලබාගත් බවට වගඋත්තරකරුවන් කොමිෂන් සභාව ඉදිරියේ කරුණු ප්‍රකාශ කිරීම හේතුවෙන් අදාල නිලධාරීන්ගෙන් 2015.11.24 දිනට පෙර වෛද්‍ය වාර්තා ලබාදෙන ලෙසට 2015.11.16 දාතම ලිපිය මගින් දැනුම්දීමක් කළ ද වගඋත්තර පාර්ශවය විසින් අධිකරණ වෛද්‍ය පෝරමයන් පමණක් ලබාදීමක් කර ඇත. වෛද්‍ය වාර්තා ලබා දීමට කටයුතු නොකිරීම හේතුවෙන් ඒ පිළිබඳව නිගමනයකට එළඹීමට හැකියාවක් නොමැත.

- මෙම රැස්වීම විසුරුවා හැරීම සඳහා කටයුතු කළ බවට, දක්වන කාරණයෙන් බැහැර විය නොහැකි බවත් එහි වගකීම දරන බවත් එදින රාජකාරි කළ වගඋත්තර පාර්ශවය කොමිෂන් සභාව ඉදිරියේ පිළිගෙන ඇති බව ද නිරීක්ෂණය වේ.

## 7. <u>සිද්ධිමය කරුණු ආශ්‍රිත නීතිමය විශ්ලේෂණය</u> :-

**7.1. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ජේදය.**

**7.1.1. වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළයුතු බව :**

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති " කිසිම තැනැත්තෙකු වධහිංසාවලට හෝ කෲර අමානුෂික අවමන් සහගත සැළකිල්ලකට

නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය. " යන අයිතිවාසිකම පිළිබඳ අවධානය යොමු කරන ලදි.

අදාල සිදුවීම පිළිබඳ කොමිෂන් සභාව සිදුකළ පරීක්ෂණයේදී දෙපාර්ශවය ඉදිරිපත් කරන ලද කරුණු සහ විමර්ශනයේදී අනාවරණය කර ගත් කරුණු අනුව සිද්ධියට අදාලව ජල ප්‍රහාර හා කඳුළු ගෑස් ප්‍රහාරවලින් පසු අඬපණව බිම වැටී සිටි හා විසිර යන සිසුන්ට බැටන් පොලු මගින් සහ ලී පොලු මගින් ශරීරයේ ඉතාමත් සංවේදී ස්ථාන වන හිස, හිස පිටුපස, පිටකොන්ද, ශරීරයේ වෙනත් අවයව වලට පහර දී ඇති බව වීඩියෝ දර්ශන, ඡායාරූප මගින් තහවුරු වන අතර වැඩිදුරටත් අධිකරණ වෛද්‍ය සාක්ෂි පිළිබඳ සලකා බැලීමේදී එම තුවාල මොට ආයුධ වලින් සිදු කළ ඒවා බව සඳහන් වන අතර බොහෝ තුවාල ශරීරයේ සංවේදී ස්ථාන වල ඇති බවත්, තුවාල ශරීරයේ පිටුපස ප්‍රදේශවල ඇති බවත් තහවුරු විය. වගඋත්තරකරුවන්ගේ ක්‍රියා කලාපය හේතුවෙන් මෙම සියළු කරුණු අනුව සිසුන් කෲර අමානුෂික අවමන් සහගත සැළකිල්ලකට භාජනය වී ඇති බවට කරුණු අනාවරණය වේ.

**71.2. නීතියේ රැකවරණය සහ සර්ව සාධාරණත්වයේ අයිතිය :**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය අනුව නීති පසිදලීම හා නීති ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණය සර්ව සාධාරණ වියයුතු බවත්, දක්වයි.

සියළුම වගඋත්තර පාර්ශව නීතිය ක්‍රියාත්මක කිරීමට ද නීතියේ දක්වා ඇති කාර්යය පටිපාටිය අනුව ක්‍රියාත්මක වූවාද යන්න මෙහිදී සලකා බලනු ලැබේ.

නීති විරෝධී රැස්වීම් විසුරුවා හැරීමේ බලය වගඋත්තර පාර්ශවයට නීතිමය ප්‍රතිපාදන අනුව හිමිවුවද මෙම සිද්ධිමය අවස්ථාවේදී වගඋත්තරකරුවන් විසින් එම නීතිමය ප්‍රතිපාදනයෙහිලා පිහිටා කටයුතු කලේ ද යන්න කෙරෙහි මෙහිදී අවධානය යොමු කරන ලදි.

එහිදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදි.

- රැස්වීමක් පැවැත්වීමට ඇති ප්‍රතිපාදන.
- රැස්වීමක් විසුරුවා හැරීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග අනුගමනය කලේද?

ප්‍රථමයෙන් රැස්වීමක් පැවැත්වීමට ඇති නීතිමය ප්‍රතිපාදන පිළිබඳ සැලකීමේදී වගඋත්තරකාර පාර්ශවය දක්වනුයේ දණ්ඩ නීති සංග්‍රහයේ 138 වැනි වගන්තිය මගින් නීති විරෝධී රැස්වීම පිළිබඳ අර්ථ නිරූපණයට මෙම සිද්ධිය අදාළ වන බවයි.

එනම්, දණ්ඩ නීති සංග්‍රහයේ 138 රැස්වීමෙහි යෙදුනු  දෙදෙනෙකුගේ හෝ ඊට වැඩි ගණනකගේ පොදු පරමාර්ථය පහත දැක්වෙන කරුණු වලින් යටත් නම් එකී රැස්වීම නීති විරෝධී බව දක්වයි.

- යම් අනර්ථයක් හෝ සාපරාධී අයුතු ඇතුළුවීමක් හෝ වෙනත් වරදක් සිදුකිරීම හෝ,
- සාපරාධී බලහත්කාරයෙන් හෝ සාපරාධී බලහත්කාර පෑමෙන් කිසියම් තැනැත්තකුට ඔහු නීතියෙන් කිරීමට නීතියෙන් බැඳී නැති දෙයක් කරන්නට හෝ කිරීමට නීතියෙන් බැඳී නැති දෙයක් කරන්නට හෝ තිබීමට නීතියෙන් බැඳී ඇති යමක් නොකර හිඳින්නට හෝ බලකිරීම.

තවද ඒ වෙලේ නීති විරෝධී නොවූ රැස්වීමක් පසුව නීති විරෝධී රැස්වීමක් විය හැකි බවයි. එසේම අපරාධ නඩු විධිවිධාන සංග්‍රහ පනත 95 අනුව යම් නීති විරෝධී රැස්වීමකට හෝ මහජන සාමයට බාධාවක් විය හැකි තැනැත්තන් පස් දෙනෙකුගෙන් හෝ ඊට වැඩි ගණනකින් යුක්ත වූ යම් රැස්වීමකට හෝ විසිර යන ලෙස යම් මහේස්ත්‍රාත්වරයෙකු හෝ පොලිස් පරීක්ෂකවරයෙකුගේ පදවියට හා අඩු පදවියක් දරණ යම් පොලිස් නිලධරයෙකු විසින් අණ කරනු ලැබිය හැකි බවද දක්වයි.

එසේම දෙපාර්තමේන්තු නියෝග අංකඃ E 5 හි ද ප්‍රසිද්ධ රැස්වීම් හා සභා යටතේ ප්‍රසිද්ධ රැස්වීම හා සභා පැවැත්වීමේදී පොලිස් අවසර පත්‍රයක් ලබා ගැනීමට තබා පොලිසියට කල් ඇතුව දැනුම් දීමටත් නීතියෙන් නියම කර නැත. නමුත් එම රැස්වීම් හැසිරවීමටත් සාමය කඩ වීමක් වන්නේ නම් විසිරයාමට අණකළ හැකි බව දක්වයි.

ඒ අනුව සාමය කඩවීමක් වන්නේ නම් රැස්වීම විසුරුවා හැරීම සඳහා පොලිසිය වෙත නීත්‍යානුකූල බලයක් ලබාදී ඇත.

"පොලිස් ආඥා පනතේ 77(1) යටතේ පෙරහැරක් ආරම්භවීමට පැය 06 කට පෙර නියමිත ස්ථානයට ආසන්න පොලිස් ස්ථානය භාර නිලධාරියාට ලියවිල්ලකින් භාරදී ඇත්නම් මිස කිසිදු ප්‍රසිද්ධ ස්ථානයකට කිසිම පෙරහැරක් ගෙනයාමක් හෝ පැවැත්වීම නොකළ යුතුය." යන්න දක්වා ඇත. නමුත් පැමිණිල්ලේ සඳහන් වන කාරණය පෙරහැර යන අර්ථ නිරූපණයට අදාළ වේද යන්න පැහැදිලි නොවෙයි.

එසේම පොලිස් ආඥා පනතේ 78(1) යම් සිද්ධි ස්ථානයක සියලුම රැස්වීම් සහ පෙරහැරවල් හැසිරවීමේදී සාමය කඩ කිරීමක් වීමට කරුණු තිබෙන විට 12 දෙනෙකු හෝ ඊට වැඩි මිනිසුන් සමූහයකට විසිර යාමට නියම කිරීමටද පොලිස් පරීක්ෂකගේ තත්ත්වය පහළ නොවන තත්ත්වයක සිටින පොලිස් නිලධාරීන්ට හැකියාවක් ඇති බව දක්වයි.

වගඋත්තරකරුවන් දක්වන මෙම නීති විරෝධී රැස්වීම් යටතට පැමිණිලිකරුවන්ගේ රැස්වීම අදාල වේද යන්න සලකා බැලිය යුතුය. වගඋත්තර පාර්ශවය හා පැමිණිලි පාර්ශවය ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමේදී HNDA සිසුන් කොළඹ කොටුව සිට වෝඩ් පෙදෙස දක්වා සාමකාමීව පාගමින් ආ බව නිරීක්ෂණය වේ. පසුව පැමිණිලිකරුවන්ට සාකච්ඡාව ලබා නොදීම නිසා සාකච්ඡාවක් ලබාදෙන තුරු රැඳී සිටි බව වගඋත්තර පාර්ශවය හා පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීමේදී නිරීක්ෂණය වේ.

ඉහල බලධාරීන් මුණගැසීමට නොහැකි වීමත් සමග සිසුන් ප්‍රකෝපකාරී ආකාරයෙන් හැසිරීම ආරම්භ කළ බව නිරීක්ෂණය වන අතර ඔවුන් රඳවා තිබූ මාර්ග බාධක බිඳ දමමින් ප්‍රකෝපකාරී ලෙස උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඇතුල්වීමට උත්සාහ කරන බව අදාල ඡායාරූප සාක්ෂි මගින් හා වීඩියෝපට නිරීක්ෂණයේදී තහවුරු වේ.

එමගින් වගඋත්තර පාර්ශවය දක්වන දණ්ඩ නීති සංග්‍රහයේ 138 යම් අනර්ථයක් හෝ සාපරාධී අයුතු ඇතුල්වීමක් හෝ වෙනත් වරදක් සිදුකිරීම හා පොලිස් ආඥා පනතේ අංක 78(1) යටතේ සාමය කඩවීමක් සිදුවීමට කරුණු තිබෙන විට විසුරුවා හැරීමට ඇති ප්‍රතිපාදන පිළිබඳ දක්වන කාරණය සනාථ වේ.

පොලිසිය විසින් මේ ආකාරයෙන් මාර්ග බාධක යෙදීමට කටයුතු කර ඇත්තේ මීට පෙර අවස්ථාවකදී සිසුන් විසින් පවත්වන ලද උද්ඝෝෂණයක සිසුන් මාර්ග බාධක බිඳ හෙලමින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයට ඇතුල් වී රජයේ දේපළට හානි කිරීම පිළිබඳව පූර්වයෙන් පැවති අත්දැකීම් සැලකිල්ලට ගැනීම බව පෙනී යයි.

මීලගට අවධානය යොමු කළ යුත්තේ වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම සිසුන් විසුරුවා හැරීම සඳහා යොදා ගත් ක්‍රමවේදය දක්වා ඇති නීතිමය ප්‍රතිපාදන හා එකගවේද යන්න පිළිබඳවයි.

වගඋත්තරකාර පාර්ශවය දක්වා සිටින්නේ ඒ පිළිබඳ පොලිස් දෙපාර්තමේන්තු නියෝග 18 හි ප්‍රතිපාදන දක්වා ඇති බවයි. එහි දක්වා ඇත්තේ අරගල සම්බන්ධයෙන් පොලිසිය ක්‍රියා කළ යුතු පිළිවෙළයි. නමුත් එහි දක්වා ඇති මහජන අරගල යන කාරණයට මෙම පැමිණිලිකරුවන් විසින් සිදුකළ උද්ඝෝෂණය අදාළ වේද යන ගැටළු පැන නගී. එහි දක්වා ඇති කාරණය වනුයේ ජාති භේදවාදී අසමගිකම්, ආගමික විරෝධතා, සමාජ හා කුල භේද, වෘත්තිය සමිති අතර එදිරිවාදිකම්, දේශපාලන පක්ෂ රැස්වීම් හා ඒවායේ කටයුතු හා පවුල් හබයි.

ඒ අනුව මෙම කාරණය එම අර්ථ නිරූපණයට නොගැනෙන බැවින් දෙපාර්තමේන්තු නියෝග 18 දක්වා ඇති ප්‍රතිපාදන නීතිවිරෝධී රැස්වීම් විසුරුවාලීම සඳහා අදාළ කරගත නොහැක.

මීළගට වගඋත්තරකාර පාර්ශවය දක්වනුයේ පොලිස් දෙපාර්තමේන්තු නියෝග ( A 19 ) අදාළ කරගත් බවයි. දෙපාර්තමේන්තු නියෝග -19 කෙරේ අවධානය යොමු කරලීමේදී එහි දක්වා ඇති නීති විරෝධී රැස්වීම් හා සෙනග එකතු වීම හා ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරිම සඳහා උපදෙස්ය. එහිදී II කොටසට අනුව සෙනග එකතුවීම සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු පිළිවෙල පිළිබඳ අවධානය යොමු කිරීමේදී එහි දක්වා ඇත්තේ,

- පිරිස විසුරුවා හැරීමට සහයෝගය ලබාගෙන මිත්‍ර ලීලාවෙන් ඉවත් කිරීමට කටයුතු කිරීමයි.
- පිරිසට බලය භාවිතා කිරීමට අවශ්‍ය වුවහොත් යෙදිය යුතු හොඳම උපක්‍රමය නිලධාරීන් අතර අත්පහුර සැදීමයි.
- එමගින් පොලිසිය තමන් අදහස් කළ පරිදි අවශ්‍ය තැනකට සෙනග ඉවත් කිරීම.

අතිසී ලෙස හැසිරෙන කලහකාරී පිරිස් විනය සම්පන්න පොලිස් කණ්ඩායම් ඉදිරියේ සන්සුන් වන බවත්, බලය පාවිච්චිය අනවශ්‍ය බවත්, කර ඇති වරදකට පිරිසකට දඬුවම් නොකළ යුතු බවත්, බලය පාවිච්චි කළ හැක්කේ වරද සිදුකරන අවස්ථාවේ බව දැන සිටිය යුතු බවත් දක්වා ඇත. ඊට අමතරව බැටන් පොලු පාවිච්චි කළ යුත්තේ එම ක්‍රමයෙන් පමණක් අදහස ඉටු කර ගන්නට තරම් පොලිස් බලය ශක්තිමත් වන විට හෝ බැටන් කණ්ඩායමට සහායට සන්නද්ධ කණ්ඩායමක් සූදානම්ව සිටින විට පමණකි යන්න දක්වා ඇත.

වගඋත්තරකාර පාර්ශවය විසින් ජලය හා කඳුළු ගෑස් භාවිතා කර සිසුන් විසුරුවා හැරීමට කටයුතු කර ඇති බව පැහැදිලි වේ. එසේ විසුරුවීමෙන් අනතුරුව බැටන් පොලු භාවිතා කරමින් පසුපස හඹා යමින් සිසුන් තවදුරටත් විසුරුවීමට කටයුතු කර ඇති බව අදාළ ඡායාරූප හා වීඩියෝ පට නිරීක්ෂණය කිරීමේදී දක්නට ලැබේ. එහිදී බැටන් පොලු භාවිතා කර විසුරුවා හැරීමට බලය ලබාදී තිබුණද එම බලය භාවිතා කිරීමේදී සාධාරණ ලෙස අවශ්‍ය බලයක් විය යුතු බව අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 95(2) හි දක්වා ඇත. ඒ අනුව අදාළ වීඩියෝ දර්ශන හා ඡායාරූප සාක්ෂි අධ්‍යයනයේදී ජලය හා කඳුළු ගෑස් වලින් පසු අඩපණ වූ සිසුන් වෙත බැටන් ප්‍රහාර එල්ල කිරීම සඳහා අවස්ථාවක් නිර්මාණය වූයේද යන ගැටළුව මෙහිදී ප්‍රශ්න ගතවේ. එසේම තවදුරටත් සිසුන් විසිරවීම කළ යුත්තේ වගඋත්තර පාර්ශවයට විසුරුවීමේ අවශ්‍යතාවයක් ඇති වන්නේ නම් පමණි. එහිදී හිස, හිස පිටුපස, පිට කොන්ද, උරහිස් සහ වෙනත් ශරීර අවයව වල තුවාල දක්නට ලැබෙන බව වෛද්‍ය වාර්තා අනුව

තහවුරු වන බැවින් මෙහිදී වගඋත්තර පාර්ශවය භාවිතා කරන ලද්දේ සාධාරණ ලෙස අවශ්‍ය වන බලයද යන්න ප්‍රශ්න සහගත වේ.

එසේම වගඋත්තරකාර පාර්ශවය භාවිතා කරන ලද බලය පිළිබඳ පැහැදිලි කිරීම සඳහා 2014.02.19 දිනැති අංක AG/24/2013 දරණ නීතිපති විසින් යොමු කරන ලද මහජන උද්ඝෝෂණ පාලනය කිරීම සඳහා රබර් උණ්ඩ භාවිතා කිරීමට වූ උපදෙස් දක්වා සිටී.

අදාල ලිපිය පිළිබඳ අවධානය යොමු කිරීමේදී එහි දක්වා ඇත්තේ "පිරිස් විසුරුවා හැරීමේ අවම බලය භාවිතා කිරීමේ අවශ්‍යතාවයයි. එහිදී වෙඩි තැබීම සඳහා රබර් උණ්ඩ භාවිතා කළ අවස්ථාවලදී වුවද බරපතල තුවාල සහ මරණය පවා සිදුවන හෙයින් පිරිස විසුරුවා හැරීමේදී භාවිතා කළ යුතු අවම බලය කුමක්ද යන්න ඒ අවස්ථාවන් වලදී සිදුවන සිද්ධිමය ක්‍රියාදාමය පිළිබඳ ගතයුතු අවස්ථානුගත තීරණයක් වන බවත් ඒ සඳහා ගත යුතු හොඳම තීරණය නිලධාරීන් තීරණය කළයුතු බවත් " දක්වා ඇත. මෙම ලිපිය මගින් ද පැහැදිලි වනුයේ නිලධාරීන් භාවිතා කළයුතු වන්නේ බරපතල තුවාල සිදු නොවන සහ මරණය සිදු නොවන අවම බලයක් වන බවයි. නමුත් අදාළ සිදුවීමේදී වගඋත්තරකරුවන් භාවිතා කරන ලද බලය අවස්ථානුකූලව සාධාරණව අවශ්‍ය වන බලය නොව එකී බල සීමාව ඉක්මවා කටයුතු කිරීමක් බවට තහවුරු වේ.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම අනුව අවම බලය මේ වනවිට නොමැති බවත් අවස්ථානුකූලව ක්‍රියා කළයුතු බවට දක්වන කරුණ පිළිබඳ අවධානය යොමු කිරීමේදී වගඋත්තර පාර්ශවයට මෙම සිද්ධියට අදාලව අවස්ථානුකූලව බැටන් පොලු ප්‍රහාර වලින් සිසුන් විසුරුවා හැරීමට අවශ්‍යතාවයක් තිබුණේ ද යන කාරණය කෙරෙහි අවධානය යොමු කිරීමේදී කොමිෂන් සභාවට තහවුරු වනුයේ ජලය හා කඳුළු ගෑස් ප්‍රහාර වලින් අඩ පණව සිටි සිසුන් තවදුරටත් බැටන් පොලු ප්‍රහාර වලින් විසුරුවා හැරීමට තරම් අවශ්‍යතාවයක් නොතිබුණු බවයි. ඒ බව අදාල ඡායාරූප හා වීඩියෝ දර්ශන වලින් තහවුරු වේ. මෙහිදී වගඋත්තර පාර්ශවය තවදුරටත් කරුණු දක්වා සිටියේ නැවත කණ්ඩායම් ගතවීම සිදු නොවීමට බැටන් ප්‍රහාර එල්ල කිරීමට සිදුවූ බවයි. නමුත් වීඩියෝ දර්ශන හා ඡායාරූප මගින් නිරීක්ෂණය වන්නේ ජල ප්‍රහාර හා කඳුළු ගෑස් ප්‍රහාර වලින් අනතුරුව සිසුන් විසිර යන ආකාරයක් සහ සමහර සිසුන් අඩපණව බිම වැතිරී සිටි ආකාරයයි. වගඋත්තරකරුවන් දක්වන ආකාරයට නැවත කණ්ඩායම් ගතවීමක් නිරීක්ෂණය නොවූ අතර බැටන් ප්‍රහාර එල්ල කරමින් සිසුන් පලවාහැරීම බලය ඉක්මවා යාමකි.

ඒ අනුව වගඋත්තර පාර්ශවය විසින් නීති විරෝධී රැස්වීමක් විසුරුවා හැරීමට නීතියේ දක්වා ඇති ප්‍රතිපාදන වලට පටහැනිව කටයුතු කිරීම තුළින් ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව නිගමනය කෙරේ.

2008 අංක 40 දරණ ජාතික මංමාවත් පනතේ 59 (1) යටතේ දක්වා ඇත්තේ මාර්ගයක්, මහාමාර්ගයක්, ජාතික මහාමාර්ගයක් අවහිර කිරීම වරදක් බවයි. නමුත් වගඋත්තර පාර්ශවය කොටුවේ සිට වෝඩ් පෙදෙස දක්වා සිසුන්ගේ පාගමන නැවැත්වීමට කටයුතු කර නැත.

### 7.1.3. අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන්, රඳවා තබා ගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස. :

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව මගින් දක්වන්නේ නීතියේ නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුතු බවයි.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පැමිණිලිකාර පාර්ශවය විසින් ශිෂ්‍යයන් 39 දෙනෙකු සිරභාරයට ගැනීම පිළිබඳව ඉදිරිපත් කළ කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන වගන්තිය මගින් තහවුරු කර ඇති අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් දැයි සළකා බලන ලදි.

මෙහිදී නීති විරෝධී අත්අඩංගුවට ගැනීම පිළිබඳ අවධානය යොමු කිරීමේදී, අත්අඩංගුවට ගැනීමට අදාළ ප්‍රතිපාදන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ 23(1) වගන්තිය යටතේ දක්වා ඇති අතර, එහි දක්වා ඇත්තේ " යම් තැනැත්තකු සිරභාරයට ගැනීමේදී ඒ සිරභාරයට ගනු ලැබූ තැනැත්තා තමා අත්අඩංගුවට ගනු ලැබීමට වචනයෙන් හෝ ක්‍රියාවෙන් අවනත නොවුවහොත් මිස ඔහු සිරභාරයට ගැනීම කරන තැනැත්තා විසින් සිරභාරයට ගනු ලබන තැනැත්තාගේ ශරීරය ස්පර්ශ කොට හෝ රඳවා තබා ඔහු සිරභාරයට ගත යුතු බවයි "

සිරභාරයට ගැනීමේ උත්සහයට ප්‍රතික්ෂප්ප කිරීමක් සිදු වන්නේ නම් සිරභාරයට ගැනීම ක්‍රියාත්මක කිරීමට සාධාරණ ලෙස අවශ්‍ය උපක්‍රම යෙදිය යුතු බව දක්වයි.

එසේම අංක ඒ 20 දෙපාර්තමේන්තු නියෝග හි සිරභාරයට ගැනීම පිළිබඳ 2 (A) හි දක්වා ඇත්තේ "සිරභාරයට ගැනීම හැකිතාක් දුරටම සාහසික ක්‍රියාවලින් තොරව කළයුතු බවයි. සිරභාරයට ගැනීමට පෙර හෝ ඉන් පසුව හෝ යම් සාහසික තැනැත්තකු මැඩ පැවැත්වීමට බලය පාවිච්චි කිරීම අවශ්‍ය වූ විට, ඉදුරාම අවශ්‍ය වන තරමට පමණක් බලය පාවිච්චි කළ යුතු බව දක්වයි.

නමුත් මෙම අවස්ථාවේදී ශිෂ්‍යයන් අත්අඩංගුවට ගැනීමේදී මෙම නීති තත්ත්වය හා නියෝග වලට පටහැනිව කටයුතු කළාද යන්න පැහැදිලිව නිරීක්ෂණය නොවේ.

**13 (1) ව්‍යවස්ථාවේ තවදුරටත් සඳහන් වන්නේ යම් තැනැත්තෙකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මතද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේය වශයෙනි :**

මේ අනුව අත් අඩංගුවට ගැනීමට හේතු පැහැදිලි නොකිරීම පිළිබඳ පැමිණිලි පාර්ශවය කොමිෂන් සභාවේ දැක්වුව ද වගඋත්තර පාර්ශවය දක්වා ඇත්තේ දණ්ඩ නීති සංග්‍රහයේ **32** වගන්තිය සමග කියවෙන 140, **153**, 314, 316 හා **2008** අංක 40 දරණ ජාතික මංමාවත් පනතේ **59**(1) යටතේ අත් අඩංගුවට ගෙන ඇති බවයි. අත් අඩංගුවට ගන්නා අවස්ථාවේ වරද පැහැදිලි කර දුන්නේද යන්න පිළිබඳ නිගමනයට එළඹීමට ප්‍රමාණවත් කරුණු අනාවරණය වී නැත. මේ හේතුවෙන් අත්අඩංගුවට ගැනීමේදී හේතුව පැහැදිලි කළ යුතුය. වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **13**(1) මගින් දක්වන ප්‍රතිපාදනය කඩවූවාද යන්න පිළිබඳව ස්ථිර නිගමනයකට එළඹීමට අසීරු වේ.

### 7.1.4. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය හා සමාගමේ නිදහස :

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) (අ) අනුව භාෂණයේ නිදහසට හා ප්‍රකාශනය ඇතුළු අදහස් පලකිරීමේ නිදහසට, (ආ) සාමකාමීව රුස්වීමේ නිදහසට (ඇ) සමාගමේ නිදහසට හිමිකම් ඇත්තේය. "

මෙහිදී මානව හිමිකම් කොමිෂන් සභාව අවධානය යොමු කරන ලද්දේ මෙම උද්ඝෝෂණය සඳහා සහභාගී වූ සිසුන්ගේ අයිතිවාසිකම් කඩවී වී ඇත්ද යන්නයි.

ඉහත අයිතිවාසිකම් මෙම ශිෂ්‍යයන්ට එකසේ හිමිවන නමුදු එය භුක්ති විඳිය යුත්තේ 15(2), 15(3), 15(4) හා 15(7) හි දක්වා ඇති සීමාවන් වලට යටත්ව වේ.

ඉහත සඳහන් සීමා යටතේ කටයුතු කිරීමේදී මෙවැනි පා ගමන්, පෙරහැරවල් පැවැත්වීමේදී නිසි අවසරයක් **2008** අංක 40 මංමාවත් පනත ප්‍රකාරව හා පොලිස් ආඥා පනතේ **77** වගන්තිය ප්‍රකාරව පෙරහැරක් ආරම්භ වීමට පෙර යටත් පිරිසෙයින් පැය **06**කට පෙර පෙරහැර ආරම්භ වීමට නියමිත ස්ථානයට ආසන්නතම පොලිස් ස්ථානය භාර නිලධාරින් වෙත ඒ පිළිබඳව දන්වා අවසර ගතයුතු වුවද පැමිණිලිකාර පාර්ශවය අදාළ අවසරය ලබා නොගත් බව පිළිගෙන ඇත.

එහෙත් සිසුන්ගේ පා ගමන ආරම්භයේ සිට වෝඩ් පෙදෙස දක්වා ගමන් කිරීම සඳහා වගඋත්තරකාර පොලිස් පාර්ශවයේ පූර්ණ සහාය ලැබී ඇති අතර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමග සාකච්ඡාවක් ලබාදීම සම්බන්ධව ද මැදිහත් වීමක් වී ඇත.

සිසුන් පලවා හැරීමට වගඋත්තරකරුවන් කටයුතු කර ඇත්තේ සිසුන් කලහකාරී ආකාරයට කටයුතු කිරීම ආරම්භ කිරීමත් සමගිනි. එබැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) වගන්තිය මගින් තහවුරු කර ඇති අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් සිදුවී ඇති බවට කරුණු අනාවරණය නොවේ.

රුස්වීම විසුරුවා හැරීම සඳහා වගඋත්තරකරුවන් යොදවා ඇති බලය නීතිමය සීමාවලින් ඔබ්බට ක්‍රියාකිරීමක් බව නිරීක්ෂණය වන අතර එය නීතිය මගින් දක්වා ඇති අවම බලය හෝ සාධාරණ අවශ්‍ය බලය යෙදීමක් නොව බලය ඉක්මවා කටයුතු කිරීමක් බව නිරීක්ෂණය වේ.

**7.1.5 ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ ප්‍රතිපාදන :**

අන්තර් ජාතික නීතිමය තත්ත්වයට අනුව වගඋත්තරකරුවන් විසින් ශිෂ්‍යයන් **වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත්** කර ඇති බව තහවුරු වීම **මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ 5 වන වගන්තිය, 7 වන වගන්තිය මෙන්ම සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියේ 7 වන වගන්තිය හා 9 වගන්තිය** මගින් තහවුරු කර ඇති මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බව පෙනී යයි.

පාර්ශවයන් ඉදිරිපත් කළ කරුණු හා විමර්ශනයේදී හෙළි වූ කරුණු අනුව පැහැදිලි වන්නේ වගඋත්තරකරුවන් විසින් නීති විරෝධී රුස්වීමක් විසුරුවා හැරීම සඳහා සාධාරණව යෙදියයුතු අවශ්‍ය කරන බලය ඉක්මවමින් උද්ඝෝෂණයේ යෙදී සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට කෲර අමානුෂික, අවමන් සහගත සැලකිල්ලකට ලක් කර ඇති බවයි. ඒ අනුව ශිෂ්‍යයන්ට හිමි නීතිමය රැකවරණය හා සර්ව සාධාරණත්වයේ අයිතිය කඩ කර ඇති බවට කරුණු අනාවරණය වේ.

## 8. <u>නිගමන හා නිර්දේශ</u> :-

### 8.1. මූලික අයිතිවාසිකම් කඩවීම:

- සමස්ථ සිදුවීම තුළ වගඋත්තරකරුවන් විසින් ශිෂ්‍යයන් සතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති 11, 12(1) හි සඳහන් මූලික අයිතිවාසිකම් වගඋත්තරකාර පොලිස් පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බව කොමිෂන් සභාව තීරණය කරන අතර පහරදීමට ලක්වී තුවාල ලබා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට එම පාර්ශවය විසින් වන්දි ලබාදියයුතු බවට නිර්දේශ කරනු ලැබේ.

  මෙහිදී පහරදීම නිසා රෝහල් ගතව සිටි ශෂිනි සංදීපනී කුමාරසිංහ ශිෂ්‍යාවට රු.25,000/-ක වන්දි මුදලක් ලබාදීමටත් පහරදීමට ලක්වී තුවාල ලැබ රෝහල් ගතව ප්‍රතිකාර ගන්නා ලද ශිෂ්‍ය ශිෂ්‍යාවන් 08 දෙනා වන 1. නුවන් ප්‍රදීප් කුමාර, 2. අයේෂ් රත්නසූරිය, 3. සුපුන් ඉෂාන්, 4. ෆාතිමා හනීනා හුසේන්, 5. සඳුනි චන්‍ද්‍රසිරි, 6. බුද්ධි උක්වත්ත, 7. නිලූකා නයනා, 8. ජීවා රූපසිංහ යන ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට රු.15,000/-ක් බැගින් වන්දි ගෙවීමට නිර්දේශ කෙරේ.

### 8.2. මෙවැනි සිදුවීම් වැළැක්වීම සඳහා ඉදිරි පියවර :

සමස්ථයක් ලෙස ගත් කළ මෙම සිද්ධියෙන් මානව හිමිකම් කොමිෂන් සභාවට ගම්‍ය වන්නේ වගඋත්තරකාර පොලිස් පාර්ශවයේ ක්‍රියාකාරකම් හි වෘත්තීය මට්ටමේ (professionalism) විශාල ඌණතා ඇති බවයි. මෙහිදී මානව හිමිකම් කොමිෂන් සභාව නිර්දේශ කරන්නේ, පහත දක්වා ඇති ආකාරයෙන් කටයුතු කරන ලෙසයි.

### 8.2.1. මහජන එක්රුස්වීම් පාලනය කිරීම සඳහා පොලිස් රෙගුලාසි සකස් කිරීම.

- කැරලි මර්ධනය සඳහා ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී රටවල් භාවිතා කරන ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව පොලිස් කොමිෂන් සභාවේ සහායද ඇතිව මානව හිමිකම් සුරක්ෂිත වන ආකාරයටත් වර්තමානයට ගැලපෙන ආකාරයේ කැරලි මර්ධන හා නීති විරෝධී මහජන එක්රුස්වීම් පාලනය කිරීමට සුදුසු ක්‍රමවේදයක් 2016.03.01 දින වනවිට සකස් කර එහි කෙටුම්පතක් මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම.

- එම ක්‍රමවේදය ප්‍රායෝගිකව භාවිතා කිරීම පිණිස විශේෂ පුහුණුවීම් (special training) ලබාදීම සහ ඒ පිළිබඳ පුහුණුවීම් අත්පොතක් සකස් කිරීම හා (Training Manual) ඒ පිළිබඳ වාර්තාවක් 2016.03.01 දින වනවිට මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට.

- මෙවැනි රැස්වීම් විසුරුවා හැරීම හා මෙවැනි සිදුවීම් වලදී නිලධාරීන් යෙදවීමේදී කාන්තා නිලධාරීන් කණ්ඩායමක් රාජකාරි සඳහා යෙදවීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන ක්‍රියාත්මක වීම පිළිබඳව අදාළ ලේඛන සමග ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැනුවත් කළයුතුය.

**8.3. විනයානුකූලව කටයුතු කිරීම:**

මෙම උද්ඝෝෂණයේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති නිලධාරීන් කවුරුන්ද යන්න හඳුනාගෙන ඔවුන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමටත් ඒ පිළිබඳව 2016.03.01 දිනට පෙර මානව හිමිකම් කොමිෂන් සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීමට නිර්දේශ කරනු ලැබේ.

මෙහිදී ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පහරදී තුවාල සිදු කිරීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් කඩ කිරීම සම්බන්ධයෙන් ඍජුව අදාළ නිලධාරීන් කවුරුන්ද, ඔවුන්ට නියෝග නිකුත් කළ නිලධාරීන් කවුරුන්ද, සහ මෙම අවස්ථාවේදී මෙම ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා සිටි නිලධාරීන් කවුරුන්ද, යන්න සොයා බලා ඔවුන්ට එරෙහිව සුදුසු විනයානුකූල පියවර ගන්නා ලෙසට නියෝග කරමු.

**8.4. මහජන ගැටළු නිරාකරණය කිරීම පිළිබඳව රාජ්‍ය බලධාරීන්ගේ නිසි අවධානය යොමු වියයුතු බව :**

මෙම ශිෂ්‍ය ගැටළුව දීර්ඝ කාලයක් තිස්සේ පවතින ගැටළුවක් වන අතර 2015.10.29 වන දින උද්ඝෝෂණයක් පවත්වන බවට මාධ්‍ය මගින් ප්‍රචාරය කිරීමට ද කටයුතු කර ඇති බව පැහැදිලි වේ. එම කාරණය අදාළ බලධාරීන්ගේ අවධානයට යොමු නොවූ බව පිළිගැනීමට හැකියාවක් නොමැත. මෙවැනි අවස්ථා වලදී විරෝධතා ව්‍යාපාර හෝ පා ගමන් වැනි සංසිද්ධීන් ආශ්‍රිතව පැන නැගෙන කළහකාරී තත්ත්වයන් මැඩ පැවැත්වීම සඳහා අදාළ බලධාරීන්ට සුවිශේෂ වගකීමක් ඇති බව අවධාරණය කරමු.

මෙවැනි ගැටළු දීර්ඝ කාලීන ප්‍රශ්න බවට පත් නොවීමට අදාළ බලධාරීන් විසින් සාධාරණ ක්‍රියාමාර්ග ගතයුතු බවත් යම් හෙයකින් එම තත්ත්වයන් විරෝධතාවයන්ට පරිවර්තනය වන විට ද එම විරෝධතා ව්‍යාපාර පා ගමන් වැනි සංසිද්ධීන් ආශ්‍රයෙන් පැන නගින කළහකාරී අවස්ථාවන් ඇති නොවීම සඳහා සුදුසු පියවරයන් කඩිනමින් ගතයුතු බවත් අවධාරණය කරමු.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලබන්නේ, උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ ශිෂ්‍යයන් විසින් 2015.11.03 වන දින පැවැත්වූ දෙවන පා ගමන සාමකාමී ලෙස පැවැත්වීමට තුඩුදුන් මූලික කරුණු ලෙස

පැමිණිලිකාර ශිෂ්‍ය පාර්ශවයත් වගඋත්තරකාර පොලිස් පාර්ශවයත් එකහෙලා ප්‍රකාශ කර සිටියේ එදින සිසුන් හමුවීමට ඉහල මට්ටමේ උසස් අධ්‍යාපන බලධාරීන් සමග සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබාදීමයි.

පොලිස් නිලධාරීන් විසින්ම අදාල බලධාරීන් මුණගැසීමට ඉඩප්‍රස්ථා ලබා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කල බව. ඉදිරිපත් කල කරුණු අනුව මානව හිමිකම් කොමිෂන් සභාවට නිරීක්ෂණය විය.

ආචාර්ය දීපිකා උඩගම.
සභාපතිනි.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නීතිඥ සාලිය පීරිස්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

අම්බිකා සත්ගුණනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නීතිඥ හමීඩ් ගසාලි හුසේන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ආචාර්ය යූ.විදානපතිරණ.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. ස/-